**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**
**කොළඹ**
*****

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>ඉන්දීය නාවික හමුදාවේ රන්විජේ නෞකාව 2021 අප්‍රේල් 14-16 කොළඹ සංචාරයක නිරත වේ</u>**

රාජ්පුත් පන්තියේ පස්වන යුධ නෞකාව වන ඉන්දීය නාවික හමුදාවේ රන්විජේ නෞකාව සුහද සංචාරයක් සඳහා 2021 අප්‍රේල් 14-16 දෙදින කොළඹ සංචාරයක නිරත වීමට නියමිතය. Anti Submarine Warfare capable Guided Missile Destroyer වර්ගයේ මෙම නෞකාව ඉන්දියාව විසින් නිෂ්පාදනය කරන ලද Bramhos සුපර් සොනික් මිසයිල වලින් ද සමන්විතය.

ඉන්දීය නාවික හමුදා නෞකාවේ සංචාරය නව අවුරුදු සමයේ ශ්‍රී ලංකාවේ ජනතාව වෙනුවෙන් එකමුතුභාවයේ සහ සමඟියේ පණිවිඩය සංකේතවත් කරමින් ඔවුන්ගේ ආරක්ෂාව, නිරෝගීභාවය සහ ප්‍රීතිය වෙනුවෙන් උණුසුම් සුබපැතුම් ගෙන එයි.

මෙම නෞකාව කපිතාන් නාරායනන් හරිහරන් මහතා විසින් මෙහෙයවනු ලබන අතර ඔහු බටහිර නාවික ප්‍රදේශය භාර අණදෙන නිලධාරී රියර් අද්මිරල් ඩබ්. ඩී. ආර්. එම්. සුදර්ශන මහතා හමු වනු ඇති අතර 2021 අප්‍රේල් 15 වන දින ඉන්දීය සාම සාධක හමුදා ස්මාරකයට සිය උපහාරය පුද කරනු ඇත.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ආරක්ෂක ක්ෂේත්‍රය තුළ දිගු කලෙක සිට සමීප සහයෝගීතාවයක් පවත්වාගෙන යනු ලබයි. දෙරට නාවික හමුදාවන් අන්‍යෝන්‍ය සුබසිද්ධියට හේතු වන පුහුණු සහ ධාරිතාවයන් ගොඩනැගීමේ කර්තව්‍යයන්හිලා සහයෝගයෙන් කටයුතු කරමින් සිටී. මෙම සුහද නෞකා සංචාරය මිත්‍රශීලී සහ සමීප අසල්වැසි රාජ්‍යයන් දෙක අතර සමීප සමුද්‍රීය සහ ආරක්ෂක සහයෝගීතතාවය ශක්තිමත් කිරීමෙහිලා ඉවහල් වන තවත් පියවරකි.

***

**කොළඹ**
**2021 අප්‍රේල් 13**